# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ඩිප්ලෝමා / උසස් ඩිප්ලෝමා ප්‍රදානය කිරීම

කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ 2007 හා 2008 යන අධ්‍යයන වර්ෂවල ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය, වාණිජවිද්‍යාවේදී (විශේෂ) උපාධිය හා ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධිය සඳහා ලියාපදිංචි වූ නමුත් තමන්ට ලබා දී තිබූ උපරිම කාලසීමාව තුළ උපාධිය සම්පූර්ණ කරගැනීමට නොහැකි වූ විද්‍යාර්ථීන් හට ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා පිරිනැමීමට කැලණිය විශ්වවිද්‍යාලය විසින් තීරණය කර ඇත.

ඒ අනුව අදාළ විද්‍යාර්ථියා විසින් සම්පූර්ණ කර ඇති විෂයයන්වලට අදාළ විෂය සම්භාර (Credits) ප්‍රමාණය අනුව මෙම ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා ප්‍රදානය කරන අතර විෂය සම්භාර 30 ක් සම්පූර්ණ කර ඇති විද්‍යාර්ථීන් හට ඩිප්ලෝමාව (SLQ Level 03) හා විෂය සම්භාර 60 ක් සම්පූර්ණ කර ඇති විද්‍යාර්ථීන් හට උසස් ඩිප්ලෝමාව (SLQ Level 04) පිරිනැමීමට නියමිත අතර මේ සඳහා සුදුසුකම් ලබා ඇති විද්‍යාර්ථීන්ගේ නාමලේඛනය, ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පවත්වනු ලබන දිනය හා ඒ සඳහා අයදුම්කරන ආකාරය පිළිබඳ විස්තර ඉදිරියේ දී දැනුම් දෙන බව මෙයින් දන්වමි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය.
කැලණිය විශ්වවිද්‍යාලය
2025.05.15